# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.10.29 |

## කො.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 7.6 දක්වා ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**

- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 7.6%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.8%
- මාසික වෙනස : 1.94%

**මූලික උද්ධමනය**

- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 6.3%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.6%
- මාසික වෙනස : 1.3%

**කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 5.7හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 7.6 දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් මේ සඳහා හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 10.0හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 12.8 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 3.8හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 5.4 දක්වා ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි. දර්ශකයෙහි වෙනස 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 4.5හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 4.8 දක්වා ඉහළ ගියේය.

2021 ඔක්තෝබර් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 1.94ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් මේ සඳහා හේතු විය. තවද, ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමවල මාසික වෙනස්වීම් පිළිවෙළින්, සියයට 0.91ක් සහ සියයට 1.03ක් ලෙස වාර්තා විය. ඒ අනුව, සහල්, කිරිපිටි, පොල් සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන (එල්.පී.ගෑස්, නඩත්තු කටයුතු/ නැවත ඉදිකිරීම්) සහ ආපනශාලා සහ හෝටල් යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම් හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක්, මාසය තුළ දී වාර්තා විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 5.0හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 6.3 දක්වා ඉහළ ගියේය. තවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 3.3හි සිට 2021 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.6 දක්වා ඉහළ ගියේය.

---

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජූනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |
| | අප්‍රේල් | 133.6 | 137.2 | 0.1 | 0.2 | 5.2 | 3.1 | 4.8 | 4.7 |
| | මැයි | 134.2 | 138.1 | 0.4 | 0.7 | 4.0 | 2.9 | 4.7 | 4.4 |
| | ජූනි | 135.3 | 138.6 | 0.8 | 0.4 | 3.9 | 3.1 | 4.7 | 4.2 |
| | ජූලි | 135.4 | 138.9 | 0.1 | 0.2 | 4.2 | 3.2 | 4.8 | 4.0 |
| | අගෝස්තු | 135.4 | 138.9 | 0.0 | 0.0 | 4.1 | 3.2 | 4.8 | 3.8 |
| | සැප්තැම්බර් | 136.3 | 139.1 | 0.7 | 0.1 | 4.0 | 2.9 | 4.7 | 3.6 |
| | ඔක්තෝබර් | 136.5 | 139.2 | 0.1 | 0.1 | 4.0 | 3.0 | 4.6 | 3.4 |
| | නොවැම්බර් | 137.1 | 139.6 | 0.4 | 0.3 | 4.1 | 3.0 | 4.6 | 3.2 |
| | දෙසැම්බර් | 138.0 | 139.7 | 0.7 | 0.1 | 4.2 | 3.5 | 4.6 | 3.1 |
| 2021 | ජනවාරි | 138.7 | 140.2 | 0.5 | 0.4 | 3.0 | 2.7 | 4.3 | 3.1 |
| | පෙබරවාරි | 139.1 | 140.4 | 0.3 | 0.1 | 3.3 | 2.6 | 4.1 | 3.0 |
| | මාර්තු | 138.9 | 141.1 | -0.1 | 0.5 | 4.1 | 3.1 | 4.0 | 3.0 |
| | අප්‍රේල් | 138.8 | 141.3 | -0.1 | 0.1 | 3.9 | 3.0 | 3.9 | 3.0 |
| | මැයි | 140.3 | 142.5 | 1.1 | 0.8 | 4.5 | 3.2 | 3.9 | 3.0 |
| | ජූනි | 142.4 | 143.1 | 1.5 | 0.4 | 5.2 | 3.2 | 4.1 | 3.0 |
| | ජූලි | 143.1 | 144.1 | 0.5 | 0.7 | 5.7 | 3.7 | 4.2 | 3.1 |
| | අගෝස්තු | 143.5 | 144.6 | 0.3 | 0.3 | 6.0 | 4.1 | 4.3 | 3.2 |
| | සැප්තැම්බර් | 144.1 | 146.0 | 0.4 | 1.0 | 5.7 | 5.0 | 4.5 | 3.3 |
| | ඔක්තෝබර් | 146.9 | 147.9 | 1.9 | 1.3 | 7.6 | 6.3 | 4.8 | 3.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව